සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019

**පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය**

කාලය : පැය 2
**Time :2hour**

# Buddhism – I

# බුද්ධ ධර්මය– I

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ **දී ඇති උපදෙස්වලට අනුව ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 01-05 දක්වා නිවැරදි පිළිතුර සොයා යටින් ඉරක් අඳින්න.**

1. මහා සඟරුවන මනා පිළිවෙත් ඇති බැවින්,
   (1) සුපටිපන්න නම් වන සේක.
   (2) ත්‍රිවිධ රත්නය නම් වන සේක.
   (3) සාමීචිපටිපන්න නම් වන සේක.
   (4) ඤායපටිපන්න නම් වන සේක.

2. අධි ශිල, අධි චිත්ත, අධි ප්‍රඥාවෙන් යුක්තව ඍජු ප්‍රතිපත්තියෙන් යෙදෙන බැවින්, සංඝරත්නය,
   (1) අඤ්ජලීකරණිය නම් වන සේක.
   (2) උජුපටිපන්න නම් වන සේක.
   (3) පාහුනෙය්‍යය නම් වන සේක.
   (4) මේ කිසිවක් නොවේ.

3. ''දුර සිට රැගෙන එන
   දෙයකින් වුව ද සැදැහෙන
   පිදුමට නිසි බැවින '' යන ගුණය
   (1) අනුත්තර ගුණය (2) පාහුනෙය්‍ය ගුණය
   (3) ආහුනෙය්‍ය ගුණය (4) උජුපටිපන්න ගුණය

4. බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ වැඩම නොකළ ස්ථානයකි.
   (1) මහියංගණය (2) නාගදීපය
   (3) කැළණිය (4) මහමෙව්නාවට

5. සිරිපා සලකුණ පිහිටුවා බුදුරජාණන් වහන්සේ දිවා කාලය විවේක සුවයෙන් වැඩි සිටියේ,
   (1) දීඝවාපියේ ය (2) දිවාගුහාවේ ය
   (3) කැළණියේ ය (4) නාගදීපයේ ය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

- **ප්‍රශ්න අංක 06-10 දක්වා සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

6. සිදුහත් බෝසතාණන් වහන්සේ........................................ පොහෝ දින උතුම් වූ බුද්ධත්වයට පත්වූ සේක
7. ........................................ වසක් පුරාවට ම මහා කරුණාවෙන් ලෝකයාට දහම් දෙසූ සේක
8. බුදු රජාණන් වහන්සේ උගන්වා ඇත්තේ........................................ වඩා 9........................................ පූජාව උසස් බවයි.
10. බුදුන් වහන්සේ අවසන් වස්කාලය ගත කළේ ........................................ ගමෙහි ය.

- **ප්‍රශ්න අංක 11-15 දක්වා ගැලපෙන පිළිතුර සොයා යා කරන්න.**

| | | |
|---|---|---|
| 11. | ශ්‍රී පාදස්ථානය | I. සර්වඥ ධාතු වැඩි ප්‍රමාණයක් නිදන් කොට තිබීම. |
| 12. | මිරිසවැටිය | II. බුද්ධත්වයෙන් නව වන මස යක්ෂයන් දමනය කිරීම. |
| 13. | මහියංගනය | III. වම් සිරිපා ලකුණ පිහිටුවීම. |
| 14. | මිහින්තලේ සේල චෛත්‍ය | IV. රන් ආසනය නිදන් කිරීම හා උන්වහන්සේගේ කේෂ ධාතු තැන්පත් කිරීම. |
| 15. | කතරගම | V. බුදුරදුන්ගේ ඌර්ණ රෝම ධාතුව නිදන් කිරීම. |

- ප්‍රශ්න අංක 16-20 දක්වා නිවැරදි ප්‍රකාශය සඳහා " √" ලකුණ ද වැරදි ප්‍රකාශය සඳහා "x" ලකුණ ද යොදන්න.

16. ශරීරයට අධික ලෙස දුක් දීම කාමසුඛල්ලිකානුයෝගයයි. ( )
17. සියලු අන්තවලින් මිදී මධ්‍යම ප්‍රතිපදාව අනුව මහා සංඝරත්නය කටයුතු කරන සේක. ( )
18. මහා කාශ්‍යප තෙරුන් පැමිණ බුදු සිරුර පැදකුණු කොට වැඳ සමුගැනීමෙන් පසුව බුදු රජාණන් වහන්සේගේ චිතකය දැල්විණි.
19. බුද්ධ පරිනිර්වාණයෙන් හත්වන දින මකුට බන්ධන නම් ශාලාවට වැඩම කරවා බුදු සිරුර එහි තැන්පත් කළහ. ( )
20. කරන දේ කියන ගුණය යථාකාරී තථාවාදී නම් වේ. ( )

(ල.2 x 20 =40)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

## Buddhism– II

බුද්ධ ධර්මය– II

Name :- .................................................... Grade : -................ Index number:-....................

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතු වේ.

1. (i) බුදුරජාණන් වහන්සේට අවසාන කාලයේ වැළඳුණ රෝගය කුමක් ද?
   (ii) බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට පෙර රහත්වීමට අදිටන් කරගත් භික්ෂුව නම් කරන්න.
   (iii) සම්බුද්ධ පරිනිර්වාණය දැනුම් දීම සඳහා ආනන්ද මාහිමියන් භික්ෂූන් වහන්සේලා රැස්කර වූයේ කුමන ස්ථානයට ද?
   (iv) චුන්දකර්මාර පුත්‍රයා බුදුන් වහන්සේට පූජා කල විශේෂිත ආහාරය කුමක් ද ?
   (v) සම්බුද්ධ පරිනිර්වාණය සිදුවූයේ කොහේදී ද?
   (vi) බ්‍රාහ්මණ පූජකයන් විසින් භාරතීය සමාජය චතුර් වර්ණයට බෙදා තිබුණි. එයින් 2ක් ලියන්න.
   (vii) ත්‍රිවිධ රත්නයෙන් 2ක් ලියන්න.
   (viii) පස්වග මහණුන්ගෙන් දෙදෙනෙකු නම් කරන්න.
   (ix) නිවන් මඟට නමකි.
   (x) ත්‍රිවිධ ශික්ෂාවෙන් 2ක් නම් කරන්න.

   (2x10=20)

2. (i) හත්දදාතී භික්ඛවේ - ආමන්තයාමි වෝ...... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල.02)
   (ii) එහි තේරුම ලියන්න. (ල.03)
   (iii) සම්බුද්ධ පරිනිර්වාණය සමයේ සිදුවූ සිදුවීම තුළින් ඔබට ගත හැකි ආදර්ශ 3ක් ලියා ඉන් දෙකක් විස්තර කරන්න. (ල.05)

3. (i) බුදුරජාණන් වහන්සේ සමානාත්මතාවයෙන් කටයුතු කළ අවස්ථා 2ක් ලියන්න. (ල.02)
   (ii) බුද්ධ චරිතයෙන් ගත හැකි නායකත්ව ලක්ෂණ 3ක් ලියන්න. (ල.03)
   (iii) බුද්ධ චරිතයේ එන නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කිරීම තුළින් ඔබේ චරිතයට ගත හැකි ආදර්ශ 3ක් ලියා ඉන් දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.05)

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. (i) සොළොස්මස්ථානයට ඇතුලත් නොවන අටමස්ථානයට ඇතුලත් පූජනීය භූමි 2ක් නම් කරන්න. (ල.02)

(ii) ඔබ වන්දනා ගමනක් යෑමේදී අනුගමනය කළ යුතු සිරිත් හා විරිත් 3 බැගින් වගුගත කරන්න. (ල.03)

(iii) ඔබ වන්දනා ගමනක් සංවිධානය කරන නායකයකු ලෙස අනුගාමිකයන් සඳහා ලබා දෙන උපදෙස් පත්‍රිකාවක් සකස් කරන්න. (ල.05)

5. (i) සිදුහත් කුමරු විසින් දඹ රුක් සෙවණේ පළඟ බැඳ වඩන ලද භාවනාව කුමක් ද? (ල.02)

(ii) භාවනාවට සූදානම් වීමට පෙර ඔබ විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් 3ක් පිළිවෙළින් ලියන්න. (ල.03)

(iii) ශිෂ්‍යයකු වන ඔබට භාවනාව ප්‍රගුණ කිරීමෙන් අත්වන වාසි උදාහරණ සහිතව විස්තර කරන්න. (අවමය උදාහරණ 3ක්) (ල.05)

6. (i) බුද්ධ මාතා යන ගරු නාමයෙන් හැඳින්වෙන මහා ප්‍රජාපතී දේවියගේ දෙමාපියන් කවුද? (ල.02)

(ii) අෂ්ට ගරුක ධර්මවල අඩංගු මුල් කරුණු තුන ලියන්න. (ල.03)

(iii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 3ක් ලියා ඉන් 2ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.05)